සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**06 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **61 S I**

**භූගෝල විද්‍යාව** **කාලය පැය දෙකයි**

නම / විභාග අංකය : ..........................................................................................................

**සැලකිය යුතුයි :- • දී ඇති උපදෙස් අනුව සියලු ම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**• අංක 1 - 5 දක්වා වූ ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

01. පාසල පිහිටා ඇති කුඩාම පරිපාලන ඒකකය වන්නේ, ............................................................ යි.
**(දිස්ත්‍රික්කය / පළාත / ග්‍රාම නිලධාරි කොට්ඨාසය)**

02. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල .................................................... දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.
**(ගම්පහ / කළුතර / ගාල්ල)**

03. අනිලමානය මගින් ....................................... මනිනු ලබයි. **(සුළගේ වේගය/ සුළං දිශාව / උෂ්ණත්වය)**

04. භූමියේ ස්වභාවය අනුව කඳුකර ප්‍රදේශවල ................................... භෝග වගා කරයි. **(පොල්/ තේ හා රබර් /වී)**

05. .............................................. අත්ලාන්තික් සාගරයේ පිහිටා ඇති දූපතකි. **(මැඩගස්කරය / තායිවානය/කියුබාව)**

**• ප්‍රශ්න අංක 6 - 10 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. රාජ්‍ය ඔසු සල මගින් ජනතාවට සහන මිලට ඖෂධ ලබා දෙයි. (..........)
07. වර්ෂාපතනය මනිනු ලබන්නේ මිලි මීටර් වලිනි. (..........)
08. හින්දු බැතිමතුන් හජ්ජි උත්සවය සමරනු ලබයි. (..........)
09. නැගෙනහිර හා දකුණ අතර පිහිටියේ ඊසාන දිශාවයි. (..........)
10. + - - + - - + - - සංකේතයෙන් දැක්වෙන්නේ පළාත් මායිමයි. (..........)

**• ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ඔබ නිවසේ ඉවත ලන ද්‍රව්‍ය, කොළ රොඩු ආදිය වළලා සාදා ගත හැකි පොහොර වර්ගයකි.
(i) රසායනික පොහොර (ii) කොම්පෝස්ට් පොහොර (iii)අකාබනික පොහොර (iv) සත්ව පොහොර

12. අතීතයේ දී මිනිසා බලශක්ති මාධ්‍යයක් ලෙස යොදා ගනු ලැබුවේ,
(i) සූර්ය ශක්තිය (ii) කාය ශක්තිය (iii) ඉන්ධන (iv) සත්ත්වයින්

13. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් අයත් පළාත වන්නේ,
(i) උතුරු පළාත (ii) උතුරුමැද පළාත (iii) මධ්‍යම පළාත (iv) සබරගමුව පළාත

14. පැදුරු කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයකි.
(i) පිළිමතලාව (ii) අම්බලන්ගොඩ (iii) බංගදෙණිය (iv) දුම්බර

15. ශ්‍රී ලංකාවත් ඉන්දියාවත් අතර පිහිටා ඇති බොක්ක වන්නේ,
(i) බෙංගාල බොක්ක (ii) මන්නාරම් බොක්ක (iii) ආරුගම් බොක්ක (iv) වැලිගම බොක්ක

- අංක 16 - 20 ප්‍රශ්න සඳහා **'A'** කොටසට අදාළ නිවැරදි පිළිතුර **'B'** කොටසින් තෝරා යා කරන්න

| 'A' | 'B' |
|---|---|
| 16. ලෝකයේ විශාලතම දූපත | 1. අනුරාධපුරය |
| 17. දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිවිසුම් ස්ථානය | 2. ග්‍රීන්ලන්තය |
| 18. අතීත වාරි ශිෂ්ටාචාරයේ කේන්ද්‍රස්ථානය | 3. නයිට්‍රජන් |
| 19. ශාක වර්ධනයට අවශ්‍ය වඩා වැදගත් වායුව | 4. මාලිමාව |
| 20. නිවැරදිව දිශාව හඳුනා ගැනීමට යොදා ගනී | 5. කොට්ටාව |
| | 6. ශ්‍රී ලංකාව |

(ල. 2 x 20 = 40)

## II - කොටස

**සැලකිය යුතුයි.**

- **පළමු ප්‍රශ්නය අනිවාර්යවේ**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න පහකට (5) පිළිතුරු සපයන්න.(පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ගණන 06 කි.)**

01. අ. ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.


i. ABC අක්ෂර අතුරින් ඔබේ පාසල අයත් දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය ලියන්න.

ii. DEF අක්ෂර අතුරින් උතුරු පළාතට අයත් දිස්ත්‍රික්කයක දැක්වෙන අක්ෂරය ලියන්න


iii. GHI අක්ෂර අතුරින් ලන්දේසි බලකොටුව දැක්වෙන අක්ෂරය ලියන්න

iv. JKL අක්ෂර අතුරින් ත්‍රිකුණාමල වරාය දැක්වෙන අක්ෂරය ලියන්න

v. MNO අක්ෂර අතුරින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය දැක්වෙන අක්ෂරය ලියන්න (1 x 5 = 5)



ආ. සපයා ඇති ලෝක සිතියම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.




i. A,B,C අක්ෂර අතුරින් ඉන්දියාව දැක්වෙන අක්ෂරය ලියන්න.

.....................................................................................................................

iu. D,E,F අක්ෂර අතුරින් බෙංගාල බොක්ක දැක්වෙන අක්ෂරය ලියන්න

.....................................................................................................................

iii. G අක්ෂරයෙන් දැක්වෙන මහාද්වීපය නම් කරන්න

.....................................................................................................................

iv. L,M,N අක්ෂර අතුරින් ඉන්දියන් සාගරය දැක්වෙන අක්ෂරය ලියන්න

.....................................................................................................................

v. S,T,U අක්ෂර අතුරින් මැඩගස්කර දූපත දැක්වෙන අක්ෂරය ලියන්න (1 x 5 = 5)


.....................................................................................................................

02. i. කාලගුණය යනු කුමක් ද?........................................................ (ල. 2)

ii. කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් අපට ඇති වන වාසි 3 ක් ලියන්න............................. (ල. 2)

iii. පහත දැක්වෙන ජල චක්‍රයේ ᵖ සිට ඊ දක්වා අවස්ථා වරහන් තුලින් තෝරා හිස්තැන් මත ලියන්න.

(වාෂ්පීකරණය/වර්ෂාව/මතුපිට ගලායාම/උත්ස්වේදනය/ඝනීභවනය)




A.

B.

C.

D.

E. (ල. 5)

03. i. පාසල අවට වටපිටාවේ දක්නට ලැබෙන ස්වාභාවික භූගෝලීය ලක්ෂණ දෙකක් ලියන්න (ල. 2)
ii. ශාක වලින් ඇති ප්‍රයෝජන තුනක් ලියන්න (ල. 3)
iii. පහත දැක්වෙන සතුන් ගෙන් ලැබෙන ප්‍රයෝජන එක බැගින් ලියන්න
A. වේයා

B. ගැඩවිල් පණුවා

C. වවුලා


D. ගිරවා

E. ඇටිකුකුළා (ල. 5)

04. i. ඔබ ජීවත් වන පරිසරය තුළ වාසය කරන ජන වර්ග දෙකක් ලියන්න (ල. 2)
ii. වියළි කලාපය තුළ වගා කරන එළවළු වර්ග තුනක් ලියන්න (ල. 3)
iii. භූමිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා පහක් ලියන්න (ල. 5)

05. i. පරිසරයට හානියක් නොවන ලෙස අපද්‍රව්‍ය බැහැර කළ හැකි ක්‍රම දෙකක් ලියන්න (ල. 2)
ii. බලශක්ති ඉල්ලුම ඉහළ යාමට හේතු තුනක් ලියන්න (ල. 3)
iii. නිවසේ බලශක්තිය අරපිරිමැස්මෙන් පරිහරණය කිරීමට අනුගමනය කළ යුතු ක්‍රම පහක් ලියන්න. (ල. 5)

06. i. වායු දූෂණය නිසා ඇති වන රෝග දෙකක් ලියන්න (ල. 2)
ii. ජීවවායු ඒකකයක් සාදා ගැනීමට යොදා ගන්නා ද්‍රව්‍ය තුනක් ලියන්න (ල. 3)
iii. පහත දැක්වෙන තොරතුරු ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න
1. පරිසරයට අලංකාරයක් ගෙන දේ
2. විෂ සහිත සර්පයෙකි
3. සංචාරක පක්ෂියෙකි
4. මැලේරියාව, ඩෙංගු වැනි රෝග බෝකරයි (ල. 5)
5. කළගුණ අනාවැකි පළ කරයි




07. i. ජලය පවතින ආකාර තුනකි. ඉන් දෙකක් නම් කරන්න (ල. 2)
ii. ජලය හිඟ වීමෙන් ඇති විය හැකි ගැටලු 3 ක් ලියන්න (ල. 3)
iii. ජල සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පහක් ලියන්න. (ල. 5)

08. i. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන පටු මුහුදු තීරුව නම් කර එහි දුර කිලෝ මීටර් වලින් ලියන්න (ල. 2)
ii. ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන තුනක් නම් කරන්න (ල. 3)
iii. "ශීඝ්‍රයෙන් දියුණු වන ශ්‍රී ලංකාව" මාතෘකාව යටතේ කෙටි විස්තරයක් ලියන්න (ල. 5)

# වර්ෂ අවසාන වාර පරීක්ෂණය - 2019
# භූගෝල විද්‍යාව- පිළිතුරු පත්‍රය
## 6 ශ්‍රේණිය

I - කොටස

01. ග්‍රාම නිලධාරි කොට්ඨාසය
02. ගම්පහ
03. සුළගේ වේගය
04. තේ හා රබර්
05. කියුබාව
06. ✓
07. ✓
08. ×
09. ×
10. ✓
11. කොම්පෝස්ට්
12. කායශක්තිය
13. උතුරු පළාත
14. දුම්බර
15. මන්නාරම් බොක්ක
16. ග්‍රීන්ලන්තය ( 2 )
17. කොට්ටාව ( 5 )
18. අනුරාධපුරය ( 1 )
19. නයිට්‍රජන් ( 3 )
20. මාලිමාව ( 4 )

(2 x 20=40)

II - කොටස

01. අ. 1.පාසල අයත් දිස්ත්‍රික්කය මාතලේ නම් A පාසල අයත් දිස්ත්‍රික්කය මහනුවර නම් B
පාසල අයත් දිස්ත්‍රික්කය නුවරඑළිය නම් C
2. F 3. H 4. K 5. N (1x5=5)
ආ.1. A 2. F 3. අප්‍රිකා මහද්වීපය 4. L
5. S (1x5=5)

02. i. යම් කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායු ගෝලයේ ස්වභාවය කාලගුණය නම් වේ (ල. 02)
ii. 1. එදිනෙදා කටයුතු මනාව සංවිධානය කර ගැනීමට හැකි වීම
2. ධීවරයින්ට හා ගොවියන්ට ඔවුන්ගේ කටයුතු සාර්ථක කර ගැනීම
3. ජීවිත හා දේපල හානි වලක්වා ගත හැකි වීම (1x3= 3)
iii.A. වාෂ්පීකරණය B. උත්ස්වේදනය C. ඝනීභවනය
D. වර්ෂාව E. මතුපිට ගලා යාම (1x5= 5)

03. i. උස්බිම්, ඇළදොළ, වනාන්තර, ගංගා (1x2= 2)
ii. සිසිලස ලබා දීම/සෙවණ ලබා දීම/ගෘහ භාණ්ඩ සෑදීම/ඉන්ධන ලබා දීම/ආහාර හා ඖෂධ ලබා දීම
(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) (1x3= 3)
iii. A. වේයා - විවිධ අපද්‍රව්‍ය කැබලි කොට ඒවා දිරාපත් කිරීමට
B. ගැඩවිල් පණුවා - පස බුරුල් කිරීම හා පස සරු කිරීම
C. වවුලා - ගස් වල බීජ ව්‍යාප්තියට සහාය වීම
D. ගිරවා - පරිසරයට සෞන්දර්යය එක් කිරීම
E. ඇටිකුකුළා - වගාවන්ට හානි කරන ගොළුබෙල්ලන් කා දමයි (1x5= 5)

04. i. සිංහල, දෙමළ, මුස්ලිම් (1x2= 2)
ii. වට්ටක්කා, මැකරල්, කැකිරි (ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.) (1x3= 3)
iii. පදිංචියට/කෘෂිකර්මාන්තයට/කර්මාන්ත ශාලා ඉදි කිරීමට/නගර ඉදි කිරීමට/වන සතුන් ගේ පැවැත්මට/
මාර්ග ඉදිකිරීමට (1x5=5)

05. i. භාවිතයට ගත හැකි ද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීම/ප්‍රතිචක්‍රීකරණය/නොදිරන ද්‍රව්‍ය අවම වශයෙන් භාවිතයට ගැනීම/ඉවත ලන භාණ්ඩ භාවිතයට ගෙන විවිධ නිර්මාණ සැකසීම/කොම්පෝස්ට් වලක් සකසා ගැනීම (1x2=2)
ii. ජන සංඛ්‍යාව වැඩිවීම/පාරිභෝගික අවශ්‍යතා ඉහළ යාම/කාර්මික කටයුතු වල වර්ධනය/ප්‍රවාහන දියුණුව/
ජීවන තත්ත්වය උසස් වීම (1x3= 3)
iii. අවශ්‍ය තැනට හා අවශ්‍ය අවස්ථාවට පමණක් විදුලි පහන් දැල්වීම/කාර්යක්ෂම විදුලි පහන් භාවිතය/තාපය අපතේ නොයන දර ලිප් භාවිතය/ආහාර පිසීමෙන් පසු ලිප නිවා දැමීම/හැකි සෑම විටම රෙදි එකවර මැද ගැනීම/ගෑස් ලිප් භාවිතයේ දී ඒ සඳහා විශේෂිත භාජන භාවිත කිරීම. (1x5=5)

06. i. කැස්ස/පෙනහලු පිළිකා/පීනස/ඇදුම/තද හිසරදය (1x2=2)
ii. මුළුතැන්ගෙයි ඉවත ලන අපද්‍රව්‍ය/සැල්වීනියා/දියහබරල/ග්ලිරිසීඩියා/පිදුරු/ගොම දියර වැනි දේ (1x3= 3)
iii. සමනලයා/නයා/සුදුරෙදි හොරා/මදුරුවා/ගෙම්බා (1x5= 5)

07. i. ඝන, ද්‍රව, වායු (ල.2)
ii. පානීය ජලය හිඟවීම, ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම, කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අඩාල වීම, ලෙඩ රෝග ව්‍යාප්ත වීම, පස නිසරු වීම, ජල විදුලි බල නිෂ්පාදනය අඩාල වීම (ල.3)
iii. නාස්තිය හා අපතේ හැරීමෙන් වැළකීම/අරපිරිමැස්මෙන් භාවිතය පිළිබඳ සැලකිලිමත් වීම/පානීය ජලය අපිරිසිදු කිරීමෙන් වැළකී සිටීම/වන වැස්ම ආරක්ෂා කිරීම හා ශාක සිටුවීමට පෙළඹ වීම/ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම/ජල සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම/වැසි ජල ටැංකි භාවිතය/ (1x5= 5)

08. i. පෝක් සමුද්‍ර සන්ධිය කිලෝමීටර් 32 කි (ල.2)
ii. නල්ලූර් කෝවිල/කොළඹ වරාය/හම්බන්තොට වරාය/මත්තල ගුවන් තොටුපල/මහනුවර දළදා මාළිගාව/ත්‍රිකුණාමල වරාය/අනුරාධපුර, පොළොන්නරුව ඓතිහාසික ස්ථාන/නුවරඑළිය, සංචාරක ස්ථාන(ගැළපෙන පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.)
iii. අධිවේගී මාර්ග ඉදි කිරීම/කෘෂි හා කාර්මික අංශවල වර්ධනය/මාර්ග සංවර්ධනය/ජලය විදුලිය හා සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම/තාක්ෂණික ක්‍රම හා උපකරණ භාවිතය වැඩි වීම/ අකර්ශනීය ස්ථාන වැඩි දියුණු කිරීම/නාගරික හා ග්‍රාමීය සංවර්ධනය (1x5= 5)
(ගැළපෙන කරුණු සඳහා ලකුණු ලබා දෙන්න)